සියලු දේශවාසී කම්කරුවනි එක්වව් !

මැතිවරණ කොමිෂන් සභාව
21 SEP 2020
රාජගිරිය

# ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

## ව්‍යවස්ථාව

2000

# ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ

# ව්‍යවස්ථාව

## පූර්විකාව

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ලාංකීය කම්කරු පංතියේ පක්ෂයයි. එය පන්තියේ පෙරටු බලඇණියයි. සංවිධානයේ උසස්ම ස්වරූපයයි.

පක්ෂයේ අරමුණ නිර්ධන පන්තියට රාජ්‍ය බලය දිනාගෙන නිර්ධන පන්ති ආඥාදායකත්වයක් පිහිටුවා සමාජවාදය හා කොමියුනිස්ට්වාදය ගොඩනැගීමයි.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය නිරතුරුවම නිර්ධන පන්තියේ සහ මුළු මහත් වැඩ කරන ජනතාවගේ වුවමනා අවලව රකියි. ඒ සඳහා අභීතව සටන් කරයි.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය මාක්ස්-ලෙනින්වාදී විද්‍යාත්මක දෘෂ්ටිය හා නිර්ධන පන්ති ජාත්‍යන්තරවාදයේ ප්‍රතිපත්තියෙන් මග පෙන්වීම ලබන, කොමියුනිස්ට්වාදීන්ගේ ස්වෙච්ඡා සටන්කාමී සංවිධානයකි. ව්‍යවහාරයේදී මාක්ස්-ලෙනින්වාදී ඉගැන්වීම් ශ්‍රී ලංකාවේ නිශ්චිත තත්ත්වයන්ට නිර්මාණාත්මක ලෙස ගැලපීමට කටයුතු කරයි.

ජාතිය, වර්ණ, වාර්ගික සම්භවය, භාෂාව, ආගම හා කුලය මත පදනම්වූ සියලු ආකාරයේ වෙනස්කම් හා අසාධාරණයන් මුලිනුපුටා දැමීම සඳහාත්, පුරුෂයින්ට මෙන්ම කාන්තාවන්ටද සමාන අයිතිවාසිකම් හා සමාන තත්ත්වයන් හිමිකරදීම සඳහාත්, මිනිසකු විසින් මිනිසකු හා ජාතියක් විසින් ජාතියක් සූරාකනු ලැබීම ඇතුළුව සියලු ආකාරයේ සූරාකෑම් මුළුමනින් අහෝසි කිරීම සඳහාත්, පක්ෂය කටයුතු කරයි. එය ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය හා ජාතික සමගිය ආරක්ෂා කරන අතර විවිධ සමාජ, වාර්ගික, ජාතික හා ආගමික කොටස් අතර අන්‍යොන්‍ය විශ්වාසය හා සහෝදරත්වය ශක්තිමත් කිරීමට කටයුතු කරයි.

ජගත් කොමියුනිස්ට් හා කම්කරු ව්‍යාපාරයේ ලෛන්ද්‍රීය කොටසක් වන ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, නිර්ධන පන්ති ජාත්‍යන්තරවාදයේ ප්‍රතිපත්ති නොකඩවා අනුගමනය කරමින් එම ව්‍යාපාරයේ සමගිය හා අන්‍යෝන්‍ය සහයෝගිතාව තවදුර ශක්තිමත් කිරීමට කටයුතු කරයි. අධිරාජ්‍යවාදයට විරුද්ධව, සාමය, අවිහරණය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික විමුක්තිය හා සමාජ ප්‍රගතිය සඳහා සටන් වැද සිටින සකල ජනතාවන්ට සහයෝගිතාව දැක්වීම හා ඊට ලාංකීය ජනතාවගේ සහයෝගය ලබාදීම පක්ෂයේ ජාත්‍යන්තර ක්‍රියාකාරීත්වයේ වැදගත් අංගයකි. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අන් පක්ෂ සමග තම සහෝදර සබඳතා ගැඹුරු කිරීමටද, එම පක්ෂවල අත්දැකීම් වලින් ප්‍රයෝජන ගැනීමටද, එම අත්දැකීම් සුදුසු අවස්ථාවලදී අපේ තත්ත්වයන්ට නිර්මාණාත්මක ලෙස ගැලපීමටද පක්ෂය කටයුතු කරයි.

පක්ෂයේ අභ්‍යන්තර සංවිධානය හා කටයුතු පදනම්ව ඇත්තේ ප්‍රජාතාන්ත්‍රික මධ්‍යගත වාදය, සාමූහික නායකත්වය, ප්‍රතිපත්ති ගරුක විවේචනය හා ස්වයං විවේචනය පිළිබඳ භාවිතයද, සාමාජිකයන්ගේ නිරන්තර ක්‍රියාශීලීභාවයට හා ඔවුන්ගේ ක්‍රියාරම්භකත්වයට අනුබලදීමද යනාදි ලෙනින්වාදී ප්‍රතිපත්ති මතය.

පක්ෂය තම සාමාජිකයින්ගෙන් මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටිය හා නිර්ධන පංති ජාත්‍යන්තරවාදයේ ප්‍රතිපත්ති තරයේ අනුගමනය කිරීමද, ප්‍රජාතාන්ත්‍රික මධ්‍යගතවාදයේ සංවිධානාත්මක ප්‍රතිපත්ති අනුව ක්‍රියා කිරීමද, කොමියුනිස්ට්වාදී සම්මතයන් හා සදාචාර තත්ත්වයන් ආරක්ෂා කිරීමද, විප්ලවයේ අධිරාජ්‍ය විරෝධි හා ප්‍රජාතන්ත්‍රවාදී අවධිය සම්පූර්ණ කිරීමත්, ඉන්පසු සමාජවාදයේ ජයග්‍රහණයත්, යථා කාලයේදී කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය කිරීමත් සඳහා, ජනතාව සමග සම්බන්ධකම් නිරන්තරයෙන් ශක්තිමත් කරගනිමින් හා ජනතාවගේ හා පක්ෂයේ අභිලාෂයන් තමන්ගේ පුද්ගලික අභිලාෂයන්ට වඩා ඉහළින් නිරන්තරයෙන් තබා ගනිමින් කම්කරු පංතියේ හා වැඩ කරන ජනතාවගේ සද්ව්‍යාපාරය වෙනුවෙන් අධිෂ්ඨානයෙන්, ආත්මපරිත්‍යාගයෙන් හා ධෛර්යයෙන් සටන් කිරීමද බලාපොරොත්තු වෙයි.

යථෝක්ත පරමාර්ථ හා අරමුණු උදෙසා කැපවීමටත්, සංවිධාන ප්‍රතිපත්ති හා සම්මතයන් පිළිගැනීමටත්, පක්ෂ අභ්‍යන්තර ජීවිතය හසුරුවන පක්ෂ ව්‍යවස්ථාව පිළිපැදීමට සහ ආරක්ෂා කිරීමටත්, පක්ෂයේ සටන්මග හා දේශපාලන ක්‍රියාමාර්ගය ජනතාව අතර ගෙනයාමටත් ශ්‍රී ලංකාවේ කොමියුනිසට් පක්ෂයේ සෑම සංවිධානයක්ම බැඳී සිටියි.

## 1. නම, ලාංඡනය, ධජය හා ගීතය

1.1 පක්ෂයේ නම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වේ.

1.2 පක්ෂයේ ලාංඡනය කතිර අතට තැබූ දෑකැත්ත සහ මිටියයි.

1.3 පක්ෂයේ ධජය පළලමෙන් දෙගුණයක දිග ඇත්තාවූත් මධ්‍යයෙහි පක්ෂ ලාංඡනය ඇත්තාවූත් චතුරශ්‍රාකාර හැඩයෙන් යුතු රතු ධජයයි.

1.4 කොමියුනිස්ට් ව්‍යාපාරයේ ජාත්‍යන්තර ගීය පක්ෂයේ ගීතය වෙයි.

## 2. පක්ෂ සංවිධානයේ ප්‍රතිපත්ති

පක්ෂයේ සංවිධානය ප්‍රජාතන්ත්‍රික මධ්‍යගත වාදයේ ප්‍රතිපත්ති මත පදනම් වේ. සංවිධානය පිළිබඳ මූලික ප්‍රතිපත්ති පහත දැක්වෙන පරිදි වනු ඇත.

2.1 පහළම මට්ටමේ සිට ඉහළම මට්ටම දක්වා සියලු ප්‍රධාන සංවිධාන ඡන්දයෙන් තේරී පත්වනු ඇත.

2.2 ඉහළ සංවිධාන හා ඒවායේ නායකයින් පහළ සංවිධාන විසින් පළ කරනු ලබන අදහස්වලට නිරන්තර සැලකිල්ල දැක්විය යුතුය. ඉහළ සංවිධාන තමන්ගේ තීරණ පහළ සංවිධානවලට පැහැදිලි කරදිය යුතු අතර නිතිපතා එම සංවිධාන වලට මග පෙන්විය යුතුය.

2.3 පක්ෂයේ පහළ සංවිධාන තම වැඩ ගැන ඉහළ සංවිධානවලට වාර්තා කොට කල්තියා අවශ්‍ය උපදෙස් ලබාගත යුතුය.

2.4 පක්ෂ වැඩවලදී සාමූහික නායකත්වය සමග පෞද්ගලික වගකීම සම්බන්ධ කළ යුතුය.

2.5 සාමාජිකයින් තම සංවිධානවලට අවනත විය යුතු අතර පහළ සංවිධාන ඉහළ සංවිධානවල අධිකාරියට අවනත විය යුතුය.

2.6 පක්ෂයේ සියලු සංවිධාන පොදු එකගතාවයෙන් තීරණ ගැනීමට වෑයම් කළ යුතුය. එහෙත් ඒකමතිකත්වයක් ඇතිකර ගත නොහැකි වූ විට වැඩි ඡන්දයෙන් තීරණ ගත යුතුය.

2.7 පක්ෂයේ සියලු සංවිධාන නිදහස්, විවෘත හා සහෝදරාත්මක ආකාරයකින් තම සාකච්ඡා පැවැත්විය යුතුය.

2.8 පක්ෂයේ පහළ සංවිධාන ඉහළ සංවිධාන වල තීරණවලින් බැඳිය යුතු අතර, අඩු දෙනා වැඩිදෙනාගේ කැමැත්තට අවනත විය යුතුය.

2.9 ප්‍රතිපත්තිගරුක විවේචනය හා ස්වයං විවේචනය පක්ෂයේ සියලු සංවිධානවල හා සාමාජිකයින්ගේ යුතුකම විය යුතුය.

2.10 සියලු සාමාජිකයින් පක්ෂයේ විනයට අනුව ක්‍රියා කළ යුතු අතර පක්ෂ විනය සෑම කෙනකුම සම්බන්ධයෙන් එක සමානව ක්‍රියාත්මක විය යුතුය.

## 3. සාමාජිකත්වය

වයස අවුරුදු 18 කට නොඅඩු වූත් පක්ෂයේ (1) වැඩපිළිවෙල, ප්‍රතිපත්තිය, ව්‍යවස්ථාව හා විනය පිළිගන්නාවූත්, (2) පක්ෂයේ මූලික ඒකකයට බැඳී, වැඩ කිරීමට හා පක්ෂයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහ (3) පක්ෂයේ ව්‍යවස්ථාව අනුව අය කරනු ලබන සාමාජික ගාස්තු ගෙවමින්, පක්ෂයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සූදානම් ඕනෑම පුද්ගලයකුට පක්ෂ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම තිබේ.

## 4. සාමාජිකයින් බඳවා ගැනීම

4.1 පක්ෂයට සාමාජිකයින් බඳවා ගනු ලබන්නේ සමූහ පදනමකින් නොව තනි තනිව පුද්ගල පදනමක් මතය.

4.2 සාමාජිකයකු වශයෙන් පක්ෂයට බැඳීමට කැමැති ඕනෑම පුද්ගලයකු තම වැඩ පොලේ හෝ තමා පදිංචි ප්‍රදේශයේ හෝ පක්ෂ ශාඛාවට එම කැමැත්ත දැන්විය යුතුය. රැකියාවක නියුතු සහෝදරයෙකු හෝ සහෝදරියකු සාමාජිකත්වය ලබා ගත යුත්තේ තම සේවා ස්ථානයෙහි හෝ වැඩ පොලෙහි ශාඛාවක් ඇත්නම් එම පක්ෂ ශාඛාවෙහිය. එම ශාඛාව ඔහුගේ/ඇයගේ මූලික ශාඛාව වන්නේය. සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම්පතට අවුරුද්දකට නොඅඩු කාලයක සිට පක්ෂයේ පූර්ණ පක්ෂ සාමාජිකත්වය දරන දෙදෙනෙකුගේ නිර්දේශය ඇතුලත් විය යුතුය. වැඩපොලේ හෝ පදිංචි ප්‍රදේශයේ හෝ ක්‍රියාත්මකවන පක්ෂ ශාඛාවක් නැත්නම් ඉල්ලුම්පත එම ප්‍රදේශය කෙරෙහි බලපැවැත්වන ප්‍රාදේශීය සභාවට හෝ ප්‍රාදේශීය සභාවක් නැතිනම් පක්ෂ දිසා සභාවට හෝ බාර දිය යුතුය. එබඳු ඉල්ලුම්පතක් ලබන පක්ෂ සංවිධානය එක් මාසයක් ඇතුලත ඒ ගැන තීරණයත් ගෙන එම තීරණය අප්‍රමාදව ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

4.3 එබඳු ඉල්ලුම් පතක් ලබා ඇති සංවිධානයට එහි සාමාජිකයින් වැඩි දෙනෙකුගේ ඡන්දයෙන් ඉල්ලුම්කරු ඇතුළත් කර ගැනීමට තීරණය කළ හැකිය. ඉල්ලුම්කරු ඇතුළත්කර ගැනීම සඳහාවූ තීරණය වලංගු වනු ඇත්තේ අදාල දිසා සභාව විසින් එය අනුමත කරනු ලැබූ විට පමණි. එසේ ඇතුළත්කර ගනු ලබන තැනැත්තකු මාස 3 කට නොඅඩු හා හය මාසයකට නොවැඩි ආධුනික කාලයකට යටත්ව අපේක්ෂක සාමාජිකයෙක් වන අතර, ශාඛාවේ රැස්වීම්වලට.සහභාගිවීමේ අයිතිය ඔහුට/ඇයට ලැබෙනු ඇත්තේ (ඔහුගේ/ඇයගේ) අපේක්ෂක සාමාජික පත ලැබුණු පසුය.

4.4 නව සාමාජිකයින් පක්ෂයට ඇතුලත් කර ගනු ලබන විට, එම නව සාමාජිකයින් ඇතුලත් කර ගැනීම නිර්දේශ කරන සාමාජිකයන් එම නව සාමාජිකයින්ගේ දේශපාලන හා පෞද්ගලික චරිතය ගැන අදාල පක්ෂ සංවිධානයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

4.5 තම රැකියාවේ ස්වභාවය නිසා හෝ මධ්‍යම කාරක සභාවට පිළිගත හැකි වෙනත් යම් හේතුවක් නිසා හෝ ඉල්ලුම්කරුවකුට 4,2 නියමය පිළිපැදීමට නොහැකි විට, පක්ෂයේ සාමාජිකයින් දෙදෙනෙකුගේ නිර්දේශය ඇතුලත් ඉල්ලුම්පතක් පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත කෙලින්ම ඉදිරිපත් කිරීමට හැකිය. එබඳු පුද්ගලයින් සාමාජිකයින් වශයෙන් බඳවා ගනු ලබන්නේ මධ්‍යම කාරක සභාව සාමාජිකත්වය සඳහා වූ ඔහුගේ/ඇයගේ ඉල්ලුම්පත අනුමත කළ පසු පමණී. එවැනි සාමාජිකයකු වැඩ කළ යුතු ශාඛාව කුමක්ද යන්න මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ඇත.

4.6 කලින් පක්ෂයේ සාමාජිකයකුව සිට ඇති පුද්ගලයකු නැවත ඇතුළත් කර ගැනෙනු ඇත්තේ අදාල දිසා සභාවේ අනුමැතිය ඇතිව මූලික සංවිධානය විසින්ය. එමෙන්ම, එසේ කළ හැක්කේ සාමාජිකත්වය නැතිව සිටි කාලපරිච්ඡේදයේදී එම පුද්ගලයාගේ දේශපාලන හැසිරීම සම්බන්ධයෙන් එම පුද්ගලයා ඇතුලත් කර ගන්නා සංවිධානය සෑහීමට පත් වෙතොත් හා ඔහු/ඇයට සාමාජිකත්වය ලැබීමට අන් කරුණු අතින් ද සුදුසුකම් ඇතොත් පමණී.

4.7 පක්ෂයෙන් නෙරපනු ලැබීම නිසා සාමාජිකත්වය අහිමිවූ කලින් පක්ෂයේ සාමාජිකයෙකුව සිටි කිසිවෙකු නැවත ඇතුළත් කර ගැනීමේ හා, වෙනත් දේශපාලන පක්ෂයක නිලතල දැරූ යම් ඉල්ලුම්කරුවකු පක්ෂ සාමාජිකත්වයට ඇතුලත් කර ගැනීමේ බලතල ඇත්තේ මධ්‍යම කාරක සභාවටය. සාමාජිකත්වය සඳහා එබඳු පුද්ගලයින්ගෙන් ලැබෙන සියළුම ඉල්ලුම්පත් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය. වෙනත් දේශපාලන පක්ෂයක ප්‍රාදේශීය මට්ටමේ නිලතල දැරූ පුද්ගලයින්ගෙන් සාමාජිකත්වය සඳහා ලැබෙන ඉල්ලුම්පත් සම්බන්ධයෙන්, තීරණය කිරීම මධ්‍යම කාරක සභාවේ අවසාන අනුමැතියට යටත්ව අදාල දිසා සභාවට පැවරෙන්නේය.

4.8 කලින් පක්ෂයේ සාමාජිකයෙකුව සිටි යම් කෙනෙකු නැවතත් පාක්ෂිකත්වය ඉල්ලා සිටින අවස්ථාවල ඔහු/ඇය පක්ෂ සාමාජිකත්වය නොමැතිව සිටි කාලයේ අනුගමනය කළ දේශපාලන ක්‍රියා කලාපය ගැන සෑහීමකට පත්විය හැකි නම් නැවත පක්ෂ සාමාජිකත්වය ලැබීමට සියලු ආකාරයෙන්ම සුදුසු යැයි පිළිගන්නේ නම් ඒ බව අදාල දිසා සභාවේ නිර්දේශ කරන්නේ නම් අපේක්ෂක කාල සීමාවකින් තොරව සාමාජිකත්වය දීමට මධ්‍යම කාරක සභාවට පුළුවන.

## 5. අපේක්ෂක සාමාජිකත්වය

5.1 පුද්ගලයෙකු පක්ෂයේ සාමාජිකයකු වශයෙන් බැඳුණු දින සිට, අපේක්ෂක සාමාජිකයකු වශයෙන් තුන් මාසයකට නොඅඩුවුත්, හය මාසයකට නොවැඩිවුත් ආධුනික කාලයක් කටයුතු කළ යුතුය. ආධුනික කාලය අවසන් වී දෙසතියක් ඇතුළත එම අපේක්ෂකයා අයත් සංවිධානය විසින් ඔහුගේ/ඇගේ සාමාජිකත්වය දීමට හෝ අවලංගු කිරීමට හෝ තීරණය කළ යුතුය. පක්ෂ ශාඛාවක් විසින් එසේ පූර්ණ සාමාජිකත්වය යම් අපේක්ෂකයකුටදීම හෝ ප්‍රතික්ෂේප කිරීම ක්‍රියාත්මක වන්නේ එම තීරණය ඉහළ සංවිධානයක් විසින් හා/හෝ මධ්‍යම කාරක සභාව විසින් අනුමත කිරීමෙන් පසුවය.

5.2 පක්ෂයේ ඉතිහාසය, සටන් මග හා ප්‍රතිපත්තිය, උපක්‍රමික ක්‍රියා පිළිවෙත හා ව්‍යවස්ථාව පිළිබඳ දැනුමක් හා මාක්ස්-ලෙනින්වාදය පිළිබඳ යටත් පිරිසෙයින් සාමාන්‍ය දැනුමක් ලබා ගැනීමද, පක්ෂයේ නායකත්වය යටතේ බහු ජනතාව අතර දේශපාලන වැඩ කිරීම පිළිබඳ යම් අත්දැකීමක් ලබා ගැනීමද අපේක්ෂක සාමාජිකයකුගේ යුතුකම වනු ඇත. එබඳු පුද්ගලයෙකුට මග පෙන්වීම හා ඔහු/ඇය සම්පූර්ණ සාමාජිකයෙකුගේ මට්ටමට වර්ධනය කිරීම අදාල පක්ෂ ශාඛාවේ යුතුකමකි.

5.3 ඡන්දය දීමේ අයිතියත්, යම් පක්ෂ කමිටුවක සාමාජිකත්වය ඇතුළුව පක්ෂයේ යම් තනතුරකට තේරී පත්වීමේ අයිතියත් හැර, පූර්ණ සාමාජිකයින්ට හිමි අන් සියළු අයිතිවාසිකම් අපේක්ෂක සාමාජිකයන්ටද හිමිය.

## 6. සාමාජිකත්වය මාරු කිරීම

6.1 සාමාජිකයකු යම් දිස්ත්‍රික්කයක් තුළ එක් ශාඛාවකින් වෙනත් ශාඛාවකට මාරු කිරීමේ බලය දිසා සභාව සතුය. සාමාජිකයකු යම් දිස්ත්‍රික්කයක ශාඛාවකින් වෙනත් දිස්ත්‍රික්කයක ශාඛාවකට මාරු කිරීමේ බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවටය.

6.2 එක් ශාඛාවකින් තවත් ශාඛාවකට කෙරෙන සියලු සාමාජික මාරු කිරීම් ව්‍යවස්ථාවේ 12 වැනි නියමයේ විධිවිධානයනට අනුකූල විය යුතුය.

6.3 සාමාජිකයකු එක් ශාඛාවකින් තවත් ශාඛාවකට මාරු කිරීම කළ හැක්කේ ඔහුගේ/ඇයගේ ඉල්ලීමක් පිට ඔහුගේ/ඇයගේ ශාඛාව මගින්ය. එම ශාඛාව ප්‍රාදේශීය සභාවක් යටතේ වේනම්, ප්‍රාදේශීය සභාව මගින් දිසා සභාවට දන්වනු ඇත. ප්‍රාදේශීය සභාවක් පවත්නා ප්‍රදේශයක එම ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම අනුවද, යථායෝග්‍ය පරිදි දිසා සභාවේ හෝ මධ්‍යම කාරක සභාවේ හෝ තීරණයක් අනුවද එවැනි මාරුවීම් කළ යුතුය.

6.4 සාමාජිකයකු පක්ෂයේ එක් ශාඛාවක සිට වෙනත් ශාඛාවකට මාරු කරනු ලබන විට, ශාඛාවේ ලේකම් එම මාරුව පිළිබඳ එම ශාඛාවේ නිරදේශය හෝ නිරීක්ෂණ හෝ දිසා සභාවට දන්වා; එම සාමාජිකයා මාරු කරනු ලබන පක්ෂ ශාඛාවට දැන ගැනීම සඳහා සාමාජික ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර සැපයිය යුතුය.

## 7. රටින් බැහැරව යාම

7.1 රටින් බැහැරව යන යම් සාමාජිකයකු තමා එසේ යෑමට පෙර ඒ සඳහා තම පක්ෂ ශාඛාවේ අවසරය ලබාගත යුතුය. පිටරට යාම සඳහා වූ එබඳු ඉල්ලීම් ගැන පක්ෂ ශාඛාව තම තීරණය ද සමග දිසා සභාව මගින් මධ්‍යම කාරක සභාවට අප්‍රමාදව දැනුම් දිය යුතුය. රටින් බැහැරව යන මධ්‍යම කාරක සභිකයින්, මධ්‍යම පාලන කොමිෂමේ හා මධ්‍යම විගණක කොමිෂමේ සාමාජිකයින්, එසේ යාමට පෙර ඒ ගැන ප්‍රථම කොට මධ්‍යම කාරක සභාවට දැනුම් දී එහි අනුමැතිය ලබාගත යුතුය.

7.2 තමන් රටින් බැහැරව යාමට පෙර, තම ගමන් විස්තර හා රටින් බැහැරව සිටින කාල පරිච්ඡේදය දැනුම් දෙමින් තම ශාඛාව හා දිසා සභාව මගින් තම ගමන ගැන මධ්‍යම කාරක සභාවට දැන්වීම් රටින් බැහැර යන සියළු සාමාජිකයින්ගේ යුතුකමයි.

7.3 ඕනෑම සාමාජිකයකු රටින් බැහැරව යන ඕනෑම අවස්ථාවක, පක්ෂයේ යහපත පිණිස යයි පක්ෂය සලකන ඕනෑම හේතුවක් උඩ එම ගමන තහනම් කිරීමට මධ්‍යම කාරක සභාවට හැකිය.

## 8. සාමාජිකත්වය අහෝසි කිරීම හෝ ඉල්ලා අස්වීම

8.1 පිළිගත හැකි හේතුවක් නැතිව තම පක්ෂ ශාඛාවේ එක දිගට රැස්වීම් තුනකට සහභාගිවීමට අසමත් වන හා හෝ තුන් මාසයකට වැඩි කලක් තම සාමාජික ගාස්තු හිඟ හිටුවා ඇති ඕනෑම සාමාජිකයකුගේ සාමාජිකත්වය අහෝසි වී ඇති සේ සැලකිය හැකිය. කෙසේ වුවද පක්ෂයේ ඕනෑම සාමාජිකයකුගේ සාමාජිකත්වය අහෝසි වී ඇතැයි සැලකෙන බවට තීරණයක් ගනු ලැබීමට පෙර, අදාල සාමාජිකයාට සති දෙකක් කල් දී පිළිගත හැකි හේතුවක් හෝ සතුටුදායක පැහැදිලි කිරීමක් ඔහු හෝ ඇය සාමාජිකයකු වන ශාඛාවට නොදුනහොත් ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය අහෝසි වූ හැටියට සලකනු ලබන බවට ඔහුට/ඇයට දැනුම් දිය යුතුය.

8.2 පක්ෂයෙන් ඉල්ලා අස්වීමට කැමති යම් සාමාජිකයකු වේ නම් ඔහු/ඇය තම ඉල්ලා අස්වීමේ අදහස හා ඊට හේතු දක්වමින් තම ශාඛාවට දැනුම් දිය යුතුය. එසේ දැනුම්දීමක් ලැබී දෙසතියක් ඇතුළත ශාඛාව එම කරුණ ගැන සලකා බලා නිසි පියවර ගත යුතුය.

## 9. සාමාජිකයින්ගේ යුතුකම

9.1 පක්ෂයේ සෑම සාමාජිකයකුම පක්ෂයේ සටන් මග හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට උනන්දුවෙන් ක්‍රියා කළ යුතුය.

9.2 පක්ෂයේ ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව ක්‍රියා කළ යුතුය.

9.3 රටේ දේශපාලන ජීවිතයේ ක්‍රියාකාරි ලෙස කටයුතු කළ යුතුය. පක්ෂයේ නායකත්වයෙන් මෙහෙයවන බහුජන අරගල සාර්ථක කිරීමට ආධාර විය යුතුය. ජනතා අරගලයේ ඉදිරි පෙරමුනේ සිටින කොටස් පක්ෂයට ඇද ගැනීමට වෑයම් කළ යුතුය.

9.4 පක්ෂ ප්‍රතිපත්තිය හා එහි උපක්‍රම සකස් කිරීමට ආධාර විය යුතුය.

9.5 මාක්ස්-ලෙනින්වාදය පිළිබඳ තම අවබෝධය දියුණු කර ගැනීමටත්, තම දෘෂ්ටිමය හා දේශපාලන දැනුම ශක්තිමත් කර ගැනීමටත්, ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට මාක්ස්-ලෙනින්වාදයේ විද්‍යාව ගැලපීමටත් උත්සාහ කළ යුතුය. මාක්ස්-ලෙනින්වාදයේ ඉගැන්වීම ජනප්‍රිය කරවිය යුතුය.

9.6 පක්ෂයේ හා තමාගේ වැඩ කටයුතුවලදී ඇතිවන දුර්වලකම් නැතිකර ගැනීම සඳහා තම පක්ෂ ශාඛාව තුළ විවේචනය හා ස්වයංවිවේචනයෙහි යෙදිය යුතුය.

9.7 පක්ෂයේ යම් ඉහළ සංවිධානයක වැඩවලද දුර්වලකම් හෝ එය විසින් කරන ලද වැරදි කිසිවක් වේ නම් ඒ ගැන අප පක්ෂ ශාඛාව මගින් මධ්‍යම කාරක සභාවට දැන්විය යුතුය. එම දුර්වලකම් හා වැරදි මගහරවා ගැනීමේ ක්‍රම, මාර්ග යෝජනා කළ යුතුය.

9.8 පක්ෂය ඉදිරියේ අවංක හා සත්‍ය ගරුක විය යුතුය.

9.9 තමා වැඩ කරන ස්ථානයේ ඇති වෘත්තීය සමිතියේ හෝ සමිති එකකට වැඩි ගණනක් ඇත්නම් පක්ෂය විසින් අනුමත කරනු ලබන වෘත්තීය සමිති...ය හා /හෝ තමාගේ විශේෂ උනන්දුවක් ඇති හෝ වෙනත් ආකාරයකින් තමා සම්බන්ධ ක්ෂේත්‍රයක බහුජන සංවිධානයක සාමාජිකයකු වශයෙන් බැඳී එවායේ වැඩවලට ක්‍රියාශීලීව සහභාගි විය යුතුය.

9.10 තමාගේ පුද්ගලික හා සමාජ කටයුතු වලදී කොමියුනිස්ට් සම්මතයන් අනුගමනය කළ යුතුය, ජනතාවගේ අභිලාෂයන් තමාගේ අභිලාෂයන්ට ඉහළින් තබා ගත යුතුය.

9.11 මාසික සාමාජික මුදල් නොකඩවා ගෙවිය යුතුය.

9.12 කල්ලිවාදී කටයුතුවල යෙදීමෙන් වැළකිය යුතුය. එබඳු කටයුතු කිසිවකට, එවා මොන ස්වරූපයෙන් ප්‍රකාශ වුවද, සහයෝගය දීමෙන් වැළකිය යුතුය.

9.13 පක්ෂයේ දෘෂ්ටිමය, දේශපාලනමය හා සංවිධානාත්මක සමගිය ආරක්ෂා කළ යුතුය.

## 10. සාමාජිකයින්ගේ අයිතිවාසිකම්

සෑම සාමාජිකයකුටම පහත සඳහන් අයිතීන් හිමිව ඇත.

10.1 පක්ෂ රැස්වීම්වලදී තම අදහස් පළ කිරීමේ අයිතිය.

10.2 ව්‍යවස්ථාවේ විධි විධානයන්ට අනුකූලව පක්ෂ කමිටුවලට හා නිලධාරීන් තෝරා පත්කර ගැනීමට, සහභාගිවීමට හා එම කමිටුවලට හෝ තනතුරුවලට තේරී පත්වීමට ඇති අයිතිය.

10.3 පක්ෂයේ වැඩපිළිවෙල, ප්‍රතිපත්තිය, උපක්‍රම හෝ පක්ෂ ජීවිතයට අදාල වෙනත් ඕනෑම කරුණක් ගැන සාකච්ඡා වලට සහභාගිවීමේ හා එම වැඩපිළිවෙළ ප්‍රතිපත්තිය, උපක්‍රම හා වෙනත් කරුණු සැකසීමට ආධාරවීමේ අයිතිය.

10.4 පක්ෂයට සාමාජිකයින් බඳවා ගැනීමට ව්‍යවස්ථානුකූලව කටයුතු කිරීම.

10.5 පක්ෂ කටයුතු හා ප්‍රතිපත්ති ගැන තම අදහස්, යෝජනා හෝ විවේචන තම පක්ෂ ශාඛාවට හා එමගින් මධ්‍යම කාරක සභාව හා ජාතික සම්මේලනය දක්වා ඉදිරිපත් කිරීමේ අයිතිය.

10.6 තම පක්ෂ ශාඛාවේ සාමූහික වැඩ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට ආධාරවීමෙන් හා ඒ සම්බන්ධ ගැටළු කිසිවක් වෙතොත් එවා පක්ෂයේ වඩා ඉහළ සංවිධානයට වාර්තා කිරීමේ අයිතිය.

10.7 තමාට විරුද්ධව යම් චෝදනාවක් ඇතොත් ඒ ගැන පරීක්ෂා කරන ලෙස ඉල්ලීමේත්, එබඳු ඉල්ලීමක් ගැන නිසි සංවිධානයෙන් පිළිතුරක් ඉල්ලා සිටීමේත් අයිතිය.

10.8 පක්ෂයේ ඕනෑම සංවිධානයක් හෝ නායකයෙකු හෝ වෙනත් සාමාජිකයකු හෝ විසින් කරන ලද වරදක් පෙන්වාදීමේ අයිතිය. එහෙත් එසේ පෙන්වාදීම අභ්‍යන්තර පක්ෂ සංවිධානයන්ට සීමා විය යුතු අතර, එබඳු කරුණු කුමන තත්ත්වයන් යටතේ වුවද සංවිධානයෙන් පිටතට නොගෙන යා යුතුය.

## 11. පක්ෂයේ සංවිධාන ව්‍යුහය

11.1 පක්ෂයේ උසස්ම සංවිධානය හා අධිකාරිය ජාතික සම්මේලනයයි.

11.2 ජාතික සම්මේලන දෙකක් අතර පක්ෂයේ ඉහළම බලධාරී මණ්ඩලය වන්නේ ජාතික සම්මේලනයෙන් තෝරාපත් කරන ලද මධ්‍යම කාරක සභාවයි.

11.3 මධ්‍යම කාරක සභාව පක්ෂ දිස්ත්‍රික්කයන් පිහිටුවා එවායේ භෞමික සීමා නියම කළ යුතුය.

11.4 ඕනෑම මහ නගරයක හෝ වෙනත් ඕනෑම නිශ්චිත ප්‍රදේශයක, එම ප්‍රදේශයේ පක්ෂ වඩවඩාත් සාර්ථක කරනු සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවීමට මධ්‍යම කාරක සභාවට හැකිය.

11.5 පක්ෂයේ දිස්ත්‍රික් භෞමික සීමා ඇතුළත ඕනෑම නිශ්චිත ප්‍රදේශයක් හෝ වැඩ පොළක් හෝ අධ්‍යාපන ස්ථානයක් සඳහා මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව පක්ෂ ශාඛා පිහිටුවීමට දිසා සභාවට හැකිය.

11.6 4.5 වගන්තියේ සඳහන් හේතු නිසා ප්‍රදේශ ශාඛාවක හෝ වැඩපොළක හෝ අධ්‍යාපන ස්ථානයක සාමාජිකයක් වශයෙන් ක්‍රියා කල නොහැකි සාමාජිකයින් සඳහා ශාඛා පිහිටුවා, එම ශාඛා ක්‍රියා කළ යුත්තේ කවර නියමයන්ට අනුකූලවද යන්න මධ්‍යම කාරක සභාව තීරණය කළ යුතුය.

## 12.1 පක්ෂ ශාඛා

12.1.1 පක්ෂ ශාඛාව පක්ෂයේ මූලික ඒකකය වනු ඇත.

12.1.2 පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් හැර අන් සියලු සාමාජිකයින් පක්ෂයේ ශාඛාවකට අයත් විය යුතුය.

12.1.3 වැඩපොලක, පක්ෂ ශාඛාවක සාමාජිකයකු ඔහුගේ ප්‍රදේශයේ පක්ෂ ශාඛාවේ රැස්වීම්වලට හා වැඩට සහභාගිවිය යුතුය. එහෙත් ඔහුට එබඳු ශාඛාවකදී පක්ෂ තීරණ ගැන ඡන්දය දීමේ අයිතියක් නැත.

12.1.4 පක්ෂ ශාඛාවක් පක්ෂයේ පූර්ණ සාමාජිකයින් පස් දෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත විය යුතුය.

12.1.5 සෑම ශාඛාවක් විසින්ම ලේකම් කෙනෙකු තෝරාපත් කර ගත යුතුය.

12.1.6 ලේකම් පක්ෂ ශාඛාවේ දේශපාලන හා සංවිධානාත්මක නායකයා වනු ඇත.

12.1.7 සාමාන්‍ය තත්ත්වයන් යටතේ යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් ශාඛාවේ රැස්වීම් කැඳවිය යුතු අතර වසරකට වරක් ශාඛා වේ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය.

12.1.8 විශාල කම්හල්වල, කාර්යාලයන්හි, අධ්‍යාපන ආයතනයන්හි, වැඩ පොලවල හා දෙපාර්තමේන්තුවල එක් ශාඛාවකට වැඩි ගණනක් පිහිටුවීම කෙරෙහි මේ නියමයට ඇතුළත් විධි විධාන කිසි අන්දමකින් අවහිරයක් නොවිය යුතුය.

12.1.9 පක්ෂ ශාඛා පිහිටුවිය යුත්තේ මධ්‍යම කාරක සභාවේ පූර්ව අනුමැතිය ඇතිව දිසා සභාවක තීරණයක් අනුව එහි දිස්ත්‍රික් සීමා ඇතුළත වන අතර, දිසා සභාවක් පිහිටුවනු ලැබ නැති යම් පරිපාලන දිස්ත්‍රික්කයක වේ නම්, එවැනි ප්‍රදේශයක් තුළ මධ්‍යම කාරක සභාව විසින් ශාඛා පිහිටුවනු ඇත.

12.1.10 ශාඛාවේ සාමාජිකයින්ගේ විනය පාලනය කිරීම.

## 12.2 ශාඛාවක මූලික කාර්යයන් මෙසේය:

12.2.1 ශාඛාව පිහිටි ප්‍රදේශයේ හෝ වැඩපොලේ ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් සොයා දැන ගැනීම, ඒවාත් පක්ෂයේ අරමුණුත් අතර අන්‍යොන්‍ය සම්බන්ධය තේරුම් ගැනීම හා ජනතාව ඔවුන්ගේ ගැටළු විසඳා ගැනීම සඳහා සංවිධානය කිරීම.

12.2.2 පක්ෂයේ දෘෂ්ටිය, එහි ප්‍රතිපත්තිය හා සටන්මග ජනතාවට තේරුම් කරදීම හා පක්ෂයේ තීරණ ක්‍රියාත්මක කිරීමට ඔවුන්ගේ සහයෝගය හා ආධාරය ලබා ගැනීම.

12.2.3 ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂාවන්ද පක්ෂ ශාඛාවේ අත්දැකීම් හා වැඩ ගැන ද පක්ෂයට නිතිපතා වාර්තා කිරීම.

12.2.4 පක්ෂයට අළුත් සාමාජිකයින් බඳවා ගැනීම හා ඔවුන්ගේ දේශපාලන වර්ධනයට ආධාර කිරීම.

12.2.5 බහුජන සංවිධානයන්හි වැඩ කරන ශාඛා සාමාජිකයින්ට මග පෙන්වීම හා ඔවුන් මෙහෙයවීම.

12.2.6 පක්ෂයේ ඉහළ සංවිධානයන්හි තීරණ ක්‍රියාත්මක කිරීම.

12.2.7 පක්ෂයේ ප්‍රකාශන විකිණීමට ආධාරවීම.

12.2.8 පක්ෂයේ සාමාජිකයින් මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටියෙන් සන්නද්ධ කිරීම හා අවශ්‍ය දැනුම හා පුහුණුවද ලැබීමට ඔවුන්ට ආධාර වීම.

12.2.9 වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීම සඳහා විවේචනයන්හි හා ස්වයංවිවේචනයෙහි යෙදීම.

## 13. අපේක්ෂක ශාඛා

13.1 පක්ෂ ශාඛාවක් පිහිටුවීම සඳහා පූර්ණ සාමාජිකයින් කිසිවකු හෝ ප්‍රමාණවත් සංඛ්‍යාවක් හෝ නැති වැඩපලවල, අධ්‍යයන ආයතනවල හෝ යම් ප්‍රදේශයක අපේක්ෂක සාමාජිකයින්ගේ පක්ෂ ශාඛාවක් පිහිටුවීම මධ්‍යම කාරක සභාවේ පූර්ව අනුමැතිය ඇතිව දිසා සභාවට කළ හැකිය.

13.2 මධ්‍යම කාරක සභාව විසින් එබඳු අපේක්ෂක සාමාජික ශාඛාවල අයිතිවාසිකම්ද එම ශාඛාවල වැඩ පාලනය කරන අන් නියමයන්ද තීරණය කළ යුතුය.

13.3 දිසා සභාව 5 වැනි නියමයේ ඇතුළත් මූලික ප්‍රතිපත්තිවලට අනුකූලව එවා මෙම නියමයේ ඇතුළත් විධිවිධාන උල්ලංඝනය නොකරන ප්‍රමාණයට අපේක්ෂක සාමාජික ශාඛාවක සාමාජිකයින්ට පූර්ණ සාමාජිකත්වයදීමේ හා, අපේක්ෂක සාමාජිකත්වය දීර්ඝ කිරීමේ හෝ අවලංගු කිරීමේ හෝ බලතල පාවිච්චි කළ යුතුය.

## 14. ප්‍රාදේශීය සභා

14.1 මධ්‍යම කාරක සභාවේ පූර්ව අනුමැතිය ඇතිව දිසා සභාවට තම පක්ෂ දිසාව තුළ යම් නිශ්චිත කරනු ලබන ප්‍රදේශයක් සඳහා ප්‍රාදේශීය සභාවක් පිහිටුවිය හැකිය. එහෙත්, එසේ නිශ්චය කරනු ලබන ප්‍රාදේශීය සභාවතුළ පක්ෂ ශාඛා තුනකට නොඅඩු සංඛ්‍යාවක් තිබිය යුතුය.

14.2 ප්‍රාදේශීය සභාව තෝරා පත් කර ගත යුත්තේ අදාල ප්‍රදේශයේ සියලු පක්ෂ ශාඛාවල මුළු සාමාජිකත්වය කෙළින්ම සහභාගිවන ප්‍රාදේශීය සම්මේලනයකදී එසේ නැතහොත්, පක්ෂයේ වඩා ඉහළ බලධාරී ආයතනයක් විසින් තීරණය කරනු ලබන පදනමක් මත නියෝජිතයින් සහභාගිවන ප්‍රාදේශීය සම්මේලනයකදීය.

14.3 ප්‍රාදේශීය සභාව සමන්විත විය යුත්තේ ප්‍රාදේශීය සම්මේලනය විසින් තීරණය කරනු ලබන සාමාජික සංඛ්‍යාවකිනි.

14.4 ප්‍රාදේශීය සභාව එය තේරී පත්වීමෙන් පසු පැවැත්වෙන තම ප්‍රථම රැස්වීමේදී තම සාමාජිකයින්ගෙන් එක් කෙනෙකු තම ලේකම් වශයෙන් තෝරා පත්කර ගත යුතුය.

14.5 ප්‍රාදේශීය සභාවේ රැස්වීම් කැඳවිය යුත්තේ එහි ලේකම් විසිනි.

14.6 ප්‍රාදේශීය සභාවේ රැස්වීම් කැඳවීමේ බලය දිසා සභාවේ ලේකම්ට හා පක්ෂයේ ප්‍රධාන ලේකම්ට ද ඇත.

14.7 තම ප්‍රාදේශීය සීමා ඇතුළත පක්ෂ ශාඛාවල ඒකාබද්ධ රැස්වීම් කැඳවීමට ප්‍රාදේශීය කාරක සභාවට බලය තිබේ.

14.8 ප්‍රාදේශීය සම්මේලනවාරයක් වසරකට වරක් පැවැත්විය යුතුය.

14.9 එම සම්මේලනයේදී ප්‍රදේශයේ පක්ෂ සාමාජිකයින්ට කෙළින්ම හෝ සම්මේලනය කැඳවනු ලබන බලධාරී ආයතන විසින් තීරණය කරනු ලබන පදනමක් මත තේරී පත්වන නියෝජිතයින් මගින් හෝ නියෝජනය විය හැකිය.

14.10 ප්‍රාදේශීය සභාවේ හෝ දිසා සභාවේ හෝ මධ්‍යම කාරක සභාවේ හෝ තීරණයක් පරිදි ප්‍රාදේශීය සම්මේලනයක් කැඳවිය හැකිය. එසේ වුවද නියමිත ප්‍රදේශයේ සාමාජිකත්වයේ බහුතරය නියෝජනය කරන ශාඛා මගින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුවහොත් ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සම්මේලනයක් කැඳවිය යුතුය.

14.11 තම තීරණයකින් ප්‍රාදේශීය සම්මේලනයක් කැඳවනු ලැබූවිට ප්‍රාදේශීය සභාව තම ක්‍රියාකාරීත්වයේ විවිධ අංශ ගැන වාර්තා ඉදිරිපත් කිරීමද සම්මේලනය සඳහා අවශ්‍ය අන් කටයුතු ඉටු කිරීමද කළ යුතුය.

14.12 ප්‍රාදේශීය සභාව ව්‍යවස්ථාවේ විධි විධානයන්ට අනුකූලවත්, මධ්‍යම කාරක සභාවේ හා තමන් ක්‍රියාත්මක වන්නේ යම් දිසා සභාවක් යටතේද එම දිසා සභාවේ තීරණවලට යටත්වත්, පක්ෂයේ සංවිධානාත්මක වැඩ කරගෙන යාමද, තම බලය පවත්නා ප්‍රදේශයේ සීමා ඇතුළත පක්ෂ නායකත්වයෙන් තිබෙන ශාඛාවලට හා බහුජන සංවිධානයන්ට නායකත්වය දීම හා එවා මෙහෙයවීමද කළ යුතුය. එහෙත්, ප්‍රාදේශීය සභාව තම ප්‍රදේශයේ පක්ෂ ශාඛා හා එවායේ සාමාජිකයින් කෙරෙහි විනය පාලනයක් නොපැවැත්විය යුතුය.

14.13 (අ) යටත් පරිසෙයින් මසකට වරක් රැස්විය යුතුය.

(ආ) තම කටයුතු පිළිබඳව දිසා සභාවට නිතිපතා වාර්තා ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ඉහළ සංවිධානයන්ගේ විගණනයට යටත්ව, තම කටයුතු සඳහා මුදල් එකතු කිරීමත් තම මූල්‍ය කටයුතු පිළිබඳ පාලනය පැවැත්වීමත් කළ යුතුය.

## 15. දිසා සභාව

15.1 පක්ෂ ශාඛා පහකට නොඅඩු ගණනක් ඇති පරිපාලන දිස්ත්‍රික්කයන් තුළ, මධ්‍යම කාරක සභාවේ තීරණය අනුව, දිසා සභාවක් පිහිටුවිය හැකිය.

15.2 දිසා සභා දිස්ත්‍රික්කය තුළ ඇති ප්‍රාදේශීය සභාවල හා ශාඛාවල කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය කළ යුතුය.

15.3 දිසා සභාව තෝරා පත්කර ගත යුත්තේ දිස්ත්‍රික් සම්මේලනය විසිනි.

15.4 දිසා සභාව තෝරා පත්කර ගනු ලැබීමට පෙර එය සමන්විත විය යුතු නියමිත සාමාජික සංඛ්‍යාව දිසා සම්මේලනය විසින් තීරණය කළ යුතුය.

15.5 සාමාන්‍ය තත්ත්වයන් යටතේ දිසා සභාව විසින් සෑම දෙවසකට වරක් දිස්ත්‍රික් සම්මේලනයක් කැඳවිය යුතුය. එය දිස්ත්‍රික්කයේ සාමාජිකයින් නියෝජනය කරන නියෝජිත සම්මේලනයක් හෝ අදාල දිස්ත්‍රික්කයේ මුළු සාමාජිකත්වයට විවෘත වන සම්මේලනයක් හෝ විය යුතුය. දිස්ත්‍රික් සාමාජිකත්වයෙන් අවම වශයෙන් අඩක්වත් එම සම්මේලනයේදී නියෝජනය නොවන්නේ නම් දිසා සම්මේලනයක් ව්‍යවස්ථානුකූලව වලංගු නොවිය යුතුය.

15.6 දිසා සභාව දිසා සම්මේලනය පවත්වනු ලබන දිනය, ස්ථානය හා එහි න්‍යාය පත්‍රයද, අවශ්‍ය තැන්වලදී නියෝජිතයින් තෝරා පත්කර ගනු ලබන පද්ධතිම තීරණය කළ යුතුය. කෙසේ වුවද න්‍යාය පත්‍රය සම්මේලනයේ අනුමැතියට යටත් විය යුතුය.

15.7 දිසා සභාව දිසා සම්මේලනයට යටත් පිරිසෙයින් සති දෙකකට පෙර සම්මේලනයේ න්‍යාය පත්‍රය හා දිසා සභාවේ වාර්තාවේ පිටපත් (කෙටුම්පත්) සාමාජිකත්වයට සැපයිය යුතුය.

15.8 දිසා සභාව විසින් හෝ මධ්‍යම කාරක සභාව විසින් හෝ තීරණය කරනු ලැබුවහොත්, නැතහොත් දිස්ත්‍රික්කයේ පක්ෂ සාමාජිකයින්ගෙන් අඩකට නොඅඩු ගණනක් නියෝජනය කරන ශාඛා විසින් ඉල්ලනු ලැබුවහොත් දිස්ත්‍රික් ලේකම් දිසා සම්මේලනයක් කැඳවිය යුතුය.

15.9 දිසා සම්මේලනයට පසු දිසා සභාව තම ප්‍රථම රැස්වීමේදී තම සාමාජිකයින් අතුරින් ලේකම් කෙනෙකුද ලේකම් මණ්ඩලයක්ද දිසා සභාවේ අන් නිලධාරීන්ද තෝරාපත්කර ගත යුතු අතර දිසා සභා රැස්වීම්වල ගණ පූරණය නියම කළ යුතුය.

15.10 යම් පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ දිසා සභා එකකට වැඩි සංඛ්‍යාවක් පිහිටුවා ඇත්නම්, එකී පරිපාලන දිස්ත්‍රික්කයේ දිසා සභාවන්හි පක්ෂයේ වැඩ කටයුතු සම්බන්ධීකරණ මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පිහිටුවිය යුතුය. එසේ පිහිටවනු ලබන දිස්ත්‍රික් සම්බන්ධීකරන මණ්ඩලයන්හි සංයුතිය සහ සාමාජික සංඛ්‍යාව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ඇත.

## 16. දිසා සභාවේ කාර්යයන්

දිසා සභාව :-

16.1 ව්‍යවස්ථාවටද, ජාතික සම්මේලනයේ හා මධ්‍යම කාරක සභාවේ තීරණවලටද අනුකූලව තම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවලට ශාඛාවලට හා සාමාජිකයින්ට දේශපාලන හා සංවිධානාත්මක නායකත්වය දිය යුතුය.

16.2 මධ්‍යම කාරක සභාවේ තීරණවලට යටත්ව පක්ෂ සාමාජිකයින් කෙරෙහි විනය පාලනය පැවැත්විය යුතුය.

16.3 පක්ෂයේ දේශපාලන හා සංවිධාන වැඩකටයුතුවලදී ප්‍රාදේශීය සභා ශාඛා හා සාමාජිකයින් දිස්ත්‍රික් මට්ටමින් නියෝජනය කළ යුතුය.

16.4 දිස්ත්‍රික්කයේ පක්ෂ නායකත්වයෙන් යුතු බහුජන සංවිධාන මෙහෙයවීම හා ඒවාට මග පෙන්වීම කළ යුතුය.

16.5 මාක්ස් - ලෙනින්වාදී අධ්‍යාපනය ප්‍රචාරය කිරීමේදී දිස්ත්‍රික්කයේ කටයුතු සංවිධානය කිරීම හා ඒවාට නායකත්වය දීම කළ යුතුය.

16.6 තම වැඩ පිළිබඳව මධ්‍යම කාරක සභාවට නිතිපතා වාර්තා ඉදිරිපත් කළ යුතුය.

16.7 අරමුදල් එකතු කිරීම හා නිසි පරිදි පාලනය කිරීම ගැනත්, දිස්ත්‍රික්කය තුළ තම කටයුතු ගැනත්, තම දිස්ත්‍රික් සීමා ඇතුළත ප්‍රාදේශීය සභාවල හා පක්ෂ ශාඛාවල අරමුදල් අධීක්ෂණය කිරීම ගැනත් වගකිව යුතුය.

16.8 දිසා සභා යටත් පිරිසයෙන් මසකට වරක් රැස්විය යුතුය.

16.9 දිස්ත්‍රික් ලේකම් මණ්ඩලය යටත් පිරිසෙයින් සතියටක වරක් රැස්වී, දිසා සභාවේ රැස්වීම් අතරතුර කාලයේදී දිස්ත්‍රික්කයේ පක්ෂ කටයුතු මෙහෙය විය යුතුය.

## 17. මධ්‍යම කාරක

17.1 ජාතික සම්මේලනය විසින් තීරණය කරනු ලබන පූර්ණ හා අපේක්ෂක සාමාජික සංඛ්‍යාවකින් මධ්‍යම කාරක සභාව සමන්විත විය යුතුය.

17.2 එය ජාතික සම්මේලන දෙකක් අතරතුර කාලයේදී පක්ෂයේ ඉහළම බලධාරී මණ්ඩලය වන අතර, තම නිල කාලය තුළ සමස්ත පක්ෂය වෙනුවෙන් තීරණ ගැනීමේ අයිතිය එයට හිමිවේ.

17.3 ජාතික සම්මේලනයට පසු ප්‍රථම රැස්වීමේදී මධ්‍යම කාරක සභාව දේශපාලන මණ්ඩලයද, ප්‍රධාන ලේකම්ද තෝරා පත් කරනු ඇති අතර තම රැස්වීම්වල ගණපූරණය තීරණය කරනු ඇත.

17.4 ජාතික සම්මේලනය අවසාන වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් මධ්‍යම කාරක සභාව තමන් විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධාරීන්ද ලේකම් මණ්ඩලය හා අවශ්‍ය විය හැකි වෙනත් බියුරෝ මණ්ඩලද තෝරා පත්කළ යුතු අතර තමන් යටතේ විවිධ දෙපාර්තමේන්තු (අංශ) පිහිටුවා, බියුරෝ මණ්ඩලය හා දෙපාර්තමේන්තු සතු බලතල නිශ්චය කළ යුතුය.

17.5 මධ්‍යම කාරක සභාව යටත් පිරිසෙයින් දෙමසකට වරක් රැස්විය යුතුය. දේශපාලන බියුරෝ මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් මාසයට දෙවරක් පැවැත්විය යුතුය. ලේකම් මණ්ඩලය යටත් පිරිසෙයින් සතියකට වරක් රැස්විය යුතුය.

17.6 මධ්‍යම කාරක සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය, දිනය හා ස්ථානය දේශපාලන බියුරෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතුය. කෙසේ වුවද, මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුට හෝ අපේක්ෂක සාමාජිකයකුට හෝ න්‍යාය පත්‍රයේ ඇතුළත් කිරීම සඳහා කල්තියා කරුණු ඉදිරිපත් කළ හැකිය. එසේ වූ කල න්‍යාය පත්‍රය අවසාන වශයෙන් තීරණය කරනු ලැබිය යුත්තේ මධ්‍යම කාරක සභාව විසිනි.

17.7 මධ්‍යම කාරක සභාවේ තීරණයකින් හෝ මධ්‍යම කාරක සභාවේ සභාවේ සාමාජිකයින්ගෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් කරනු ලබන ඉල්ලීමක් උඩ හෝ මධ්‍යම කාරක සභාවේ රැස්වීම් කැඳවිය යුතුය.

## 18. මධ්‍යම කාරක සභාවේ සමාන්‍ය බලතල

වෙනත් වගන්තිවල සඳහන් බලතලවලට අමතරව පහත දැක්වෙන බලතල ද මධ්‍යම කාරක සභාවට ඇත.

18.1 පක්ෂයේ සටන් මග හා ජාතික සම්මේලනය විසින් සම්මත කරන ලද දේශපාලන ක්‍රියාමාර්ග හා වෙනත් තීරණ ක්‍රියාත්මක කිරීම.

18.2 පක්ෂයේ ව්‍යවස්ථාව තේරුම් කිරීම, එහි අර්ථ නිරූපණය කිරීම හා ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.

18.3 පක්ෂයේ සමස්ත සාමාජිකත්වය හා සංවිධාන කෙරෙහි විනය පාලනය පැවැත්වීම හා ඒ සම්බන්ධයෙන් නිශ්චිත පියවර ගැනීමේ අයිතිය.

18.4 ඕනෑම පහළ සංවිධානයක් පිහිටුවීම, විසුරුවා හැරීම, ප්‍රතිසංවිධානය කිරීම හා අත්හිටුවීම.

18.5 ජාතික සම්මේලනයේ තීරණවලට අනුකූලව බහුජනතාවගේ යහපත උදෙසා බහුජන අරගලවලට සහ පක්ෂයේ දේශපාලන හා සංවිධාන කටයුතුවලට නායකත්වය දීම.

18.6 පක්ෂයේ පුවත්පත් හා අන් ප්‍රකාශන මුද්‍රණය කිරීම හා පළ කිරීම, පක්ෂයේ පුවත්පත්වල කර්තෘවරුන් හා කර්තෘ මණ්ඩල පත් කිරීම.

18.7 පක්ෂයේ ජාතික සම්මේලනය හා අවශ්‍ය විට විශේෂ ජාතික සම්මේලන හා සාකච්ඡා සම්මේලන කැඳවීම.

18.8 වෙනත් දේශපාලන පක්ෂ හා සංවිධාන සමග සබඳතාවලදී පක්ෂය නියෝජනය කිරීමේ බලය.

18.9 ව්‍යවස්ථාවට අනුව දිසා සභාවල ප්‍රාදේශීය සභාවල, ශාඛාවල හා පක්ෂයේ අන් සංවිධානවල භෞමික සීමා තීරණය කිරීම.

18.10 පක්ෂයේ පූර්ණ කාලීන කාර්යකරුවන් පත්කිරීම, මෙහෙයවීම හා ඉවත් කිරීම.

18.11 පක්ෂයේ නිලධාරීන්ගේ හා බියුරෝ මණ්ඩලවල කාර්යයන් නියම කිරීම හා පැවරීම.

18.12 තම බලතල පක්ෂයේ අන් සංවිධානයන්ට නිලධාරීන්ට හා පක්ෂ සාමාජිකයින්ට පැවරීම.

18.13 පක්ෂ සාමාජිකයින් හා පක්ෂයේ සංවිධාන විසින් කරන ලද සේවාවන් අගය කිරීම සහ ඒවා ප්‍රකාශ කිරීම.

18.14 පාර්ලිමේන්තුව හා පළාත්පාලන සහා ඇතුළු නියෝජිත ආයතන සඳහා වූ මැතිවරණවලදී පක්ෂයේ අපේක්ෂකයින් නම් කිරීම.

18.15 මධ්‍යම කාරක සභාවේ කටයුතු ගැන පක්ෂයේ පහළ සංවිධානයන්ට වාර්තා කිරීම හා ඒවායේ අදහස් විමසීම.

18.16 පක්ෂයේ ප්‍රතිපත්ති සංවිධානය හා වැඩ කටයුතු ගැන ජාතික සම්මේලනයට වාර්තාඉදිරිපත් කිරීම.

18.17 අවශ්‍ය වූ විට පක්ෂයේ පහළ සංවිධාන වල රැස්වීම් හා සාකච්ඡා සභා කැඳවීම.

18.18 යම් පක්ෂ සාමාජිකයකුට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීමට තිබෙන විට පක්ෂයේ යහපත සඳහා එම සාමාජිකයාගේ සාමාජිකත්වය අවශ්‍ය වුවහොත් අත්හිටුවීම.

18.19 පක්ෂයට සාමාජිකයින් බඳවා ගැනීම අනුමත කිරීම.

18.20 මධ්‍යම පාලක කොමිසමේ හා මධ්‍යම විගණන කොමිසමේ පුරප්පාඩු පිරවීම.

18.21 මධ්‍යම කාරක සභාවේ බියුරෝ මණ්ඩල වල හා දෙපාර්තමේන්තුවල සංයුතිය හා කාර්යයන් තීරණය කිරීම.

18.22 පක්ෂයේ ජාත්‍යන්තර සබඳතා පැවැත්වීම සංවර්ධනය කිරීම හා පාලනය කිරීම.

18.23 මධ්‍යම කාරක සභාවේ පූර්ව තීරණයක් ඇතිව මධ්‍යම කාරක සභාවේ සාකච්ඡාවන්හි අවශ්‍යතාවයන් අනුව ඉන් බාහිර පක්ෂ සාමාජිකයකු හෝ සාමාජිකයින් මධ්‍යම කාරක සභාවේ රැස්වීමකට හෝ රැස්වීම්වලට කැඳවීමට හෝ යම් පක්ෂ සාමාජිකයෙකු ලවා යම් නිශ්චිත කරුණක් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරවීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

18.24 රටතුළ දේශපාලන අයිතීන් හෝ දේශපාලන ක්‍රියාකාරීත්වය සීමා කිරීම හෝ තිසා ව්‍යවස්ථාවේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට බාධා පැමිණි අවස්ථාවක පක්ෂ ව්‍යවස්ථාවේ යම් නියමයන් අත්හිටුවීමේ හා අවශ්‍ය විය හැකි පරිදි තාවකාලික නියමයන් පැනවීමේ අයිතිය.

## 19. දේශපාලන බියුරෝ මණ්ඩලය

දේශපාලන බියුරෝ මණ්ඩලය :-

19.1 මධ්‍යම කාරක සභාවේ රැස්වීම් දෙකක් අතරතුර කාලයේදී මධ්‍යම කාරක සභාව වෙනුවෙන් ක්‍රියා කිරීමත් තීරණ ගැනීමත් කළ යුතුය.

19.2 මධ්‍යම කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක කළ යුතුය.

19.3 මධ්‍යම කාරක සභාව වෙනුවෙන්, එහි අනුමැතියට යටත්ව, පක්ෂයේ දෛනික කටයුතු මෙහෙය විය යුතුය.

19,4 තම කටයුතු ගැන මධ්‍යම කාරක සභාවට නිතිපතා වාර්තා කළ යුතුය.

19.5 මධ්‍යම කාරක සභාව විසින් සලකා බලනු ලැබීම සඳහා වාර්තා හා යෝජනා ඉදිරිපත් කළ යුතුය.

## 20. ජාතික සම්මේලනය

20.1 ජාතික සම්මේලනය පක්ෂයේ උසස්තම අධිකාරිය හා සංවිධානය වනු ඇත. ජාතික සම්මේලනයේ තීරණ අවසාන තීරණ වනු ඇති අතර සියලු සාමාජිකයින් හා සංවිධාන එවා ක්‍රියාත්මක කිරීමට ව්‍යවස්ථාවෙන් බැඳී සිටී.

20.2 සාමාන්‍ය තත්ත්වයන් යටතේ තුන් වසරකට වරක් ජාතික සම්මේලනය කැඳවිය යුතුය. එකී කාල පරිච්ජේදය තුළ සම්මේලනය කැඳවීම වළක්වන යම් බාධක ඇතොත් එක් වසරකට නොවැඩි කාලයකට එය කල් දැමිය හැකිය. කෙසේ වුවද, එසේ කල් දමනු ලැබුවහොත් මධ්‍යම කාරක සභාව එම තීරණයට හේතු දක්වෙන යෝජනා වක් සම්මත කොට එය සාමාජිකයින්ට දැනුම් දිය යුතුය.

20.3 ජාතික සම්මේලනය කැඳවිය යුත්තේ මධ්‍යම කාරක සභාවේ තීරණයක් අනුව හෝ පක්ෂයේ සමස්ත සාමාජිකත්වයෙන් අඩකට නොඅඩු පිරිසක් නියෝජනය කරන පක්ෂ සංවිධානවල ඉල්ලීම පිටය.

20.4 ජාතික සම්මේලනය ව්‍යවස්ථානුකූලයයි සලකනු ලබන්නේ සාමාජිකත්වයෙන් අඩකට නොඅඩු පිරිසක් නියෝජනය කරන නියෝජිතයින් එයට සහභාගී වෙතොත් පමණි.

20.5 මධ්‍යම කාරක සභාව ජාතික සම්මේලනය කැඳවනු ලබන දින හා ස්ථානයද එහි න්‍යාය පත්‍රයද ජාතික සම්මේලනයට නියෝජිතයින් තෝරා පත් කර ගත යුතු පදනම හා ආකාරයද තීරණය කල යුතුය. කෙසේ වුවද, න්‍යාය පත්‍රය ජාතික සම්මේලනයේ අනුමැතියට යටත් විය යුතුය.

20.6 ජාතික සම්මේලනයට නියෝජිතයින් තෝරා පත් කර ගත යුත්තේ සමානුපාතික නියෝජනයේ පදනම මත සමස්ත සාමාජිකත්වයම නියෝජනය සහතික කෙරෙන ආකාරයකිනි.

20.7 ජාතික සම්මේලනයට සහභාගිවන නියෝජිතයින් වශයෙන් තේරී පත්වීමට සුදුසුකම ඇත්තේ අදාල සංවිධානය විසින් නියෝජිතයින් තෝරා පත්කරනු ලබන දිනට පක්ෂය තුළ එක් අවුරුද්දකට නොඅඩු කාලයක් සාමාජිකත්වය ඇති පක්ෂයේ පූර්ණ සාමාජිකයින්ට පමණි.

20.8 ජාතික සම්මේලනයට සහභාගිවන නියෝජිතයින්ගේ අයිතිවාසිකම් වලට සමාන අයිතිවාසිකම් ඇතිව ජාතික සම්මේලනයට සහභාගිවීමට මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ට අයිතිය ඇත.

20.9 පාලන කොමිසමේ සාමාජිකයින්ට හා මධ්‍යම විගණන කොමිෂමේ සාමාජිකයින්ට ජාතික සම්මේලනයට සහභාගී විය හැකිය. එහෙත් තමන් නියෝජිතයින් ලෙස පත්ව ඇතිනම් මිස ඔවුනට තේරී පත්වන නියෝජිතයකු සතු අයිතිවාසිකම් නොලැබෙයි.

20.10 සම්මේලනය කැඳවනු ලැබීමට යටත් පිරිසෙයින් සති හයකට පෙර කෙටුම්පත් න්‍යාය පත්‍රය හා ප්‍රධාන කෙටුම්පත් වාර්තාවල පිටපත් පක්ෂ ශාඛාවලට යැවිය යුතු ආකාරය හා පදනම දැනුම් දිය යුතුය.

20.11 කෙටුම්පත් න්‍යාය පත්‍රයට, කෙටුම්පත් වාර්තාවලට, යෝජනාවලට හා ව්‍යවස්ථාවට සංශෝධනයද, ජාතික සම්මේලනය විසින් සලකා බලනු ලැබීම සඳහා යම් අභියාචන ඇත්නම් ඒවාද ජාතික සම්මේලනය රැස්වන දිනට යටත් පිරිසෙයින් සති දෙකකට පෙර පක්ෂ ශාඛා විසින් මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

20.12 මධ්‍යම කාරක සභාවට, මධ්‍යම පාලක කොමිෂමට හා මධ්‍යම විගණක කොමිෂමට තෝරා පත්කර ගැනීම සඳහා පක්ෂ ශාඛා විසින් කරනු ලබන නාම යෝජනා ජාතික සම්මේලනයට යටත් පිරිසෙයින් සති දෙකකට පෙර මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

20.13 මධ්‍යම කාරක සභාවට, මධ්‍යම පාලන, කොමිෂමට හා මධ්‍යම විගණක කොමිෂමට තෝරා පත්කර ගැනීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට මධ්‍යම කාරක සභාවටද අයිතිය ඇත.

## 21. ජාතික සම්මේලනයේ බලතල හා අයිතිවාසිකම්

පහත දැක්වෙන පරිදි වනු ඇත.

21.1 ජාතික සම්මේලනයේ න්‍යාය පත්‍රය හා ස්ථාවර නියෝග සම්මත කිරීම.

21.2 පක්ෂයේ වැඩ පිළිවෙල, පක්ෂයේ දේශපාලන ක්‍රියාමාර්ගය හා පක්ෂයේ ව්‍යවස්ථාව තීරණය කිරීම හා අවශ්‍ය පරිදි ඒවා සංශෝධනය කිරීම.

21.3 මධ්‍යම කාරක සභාව හා මධ්‍යම පාලන කොමිෂම හා මධ්‍යම විගණක කොමිෂම විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයන් ඇතොත් සලකා බැලීම හා ඒ පිළිබඳ නිසි තීරණ ගැනීම.

21.4 මධ්‍යම විගණක කොමිෂම හා මධ්‍යම පාලන කොමිෂමේ වාර්තා සලකා බැලීම.

21.5 මධ්‍යම කාරක සභාවේ, මධ්‍යම පාලන කොමිෂමේ හා මධ්‍යම විගණන කොමිෂමේ සංයුතිය තීරණය කිරීම සහ එම මණ්ඩල තෝරා පත් කිරීම.

21.6 ජාතික සම්මේලනය විසින් තෝරා පත්කර ගනු ලබන මධ්‍යම කාරක සභාවට තේරී පත්වීමට සුදුසුකම් ඇත්තේ අඛණ්ඩව වසර පහකට නොඅඩු කාලයක් පක්ෂයේ සාමාජිකත්වය දරන පූර්ණ සාමාජිකයන්ට පමණි.

21.7 මධ්‍යම පාලන කොමිෂම සහ මධ්‍යම විගණක කොමිෂම තෝරා පත් කිරීමේදී ඒ සඳහා පත් කරනු ලබන පාක්ෂිකයින්ට වසර දහයකට නොඅඩු අඛණ්ඩ පක්ෂ සාමාජිකත්වයක් තිබිය යුතුය.

## 22. විශේෂ ජාතික සම්මේලනය

22.1 සම්මේලන දෙකක් අතරතුර කාලයේදී විශේෂ හෝ වැදගත් ස්වභාවයේ හෝ කරුණක් ගැන තීරණයක් ගැනීමේ නිශ්චිත කාරයය සඳහා විශේෂ ජාතික සම්මේලනයක් කැඳවීමේ බලය මධ්‍යම කාරක සභාවට ඇත. විශේෂ ජාතික සම්මේලනයක තීරණ පක්ෂයේ සමස්ත සාමාජිකත්වයත් මධ්‍යම කාරක සභාව ඇතුළු එහි සියළු සංවිධානත් පිළිගෙන ක්‍රියාත්මක කළ යුතුය.

22.2 විශේෂ ජාතික සම්මේලනයක් කැඳවීම හා එහි වැඩ කටයුතු කෙරෙන ආකාරය පිළිබඳව ව්‍යවස්ථාවේ ජාතික සම්මේලනයට අදාල 20.3, 20.4, 20.5, 20.6, 20.7, 20.8, 20.9, 20.10, 21.1, යන නියමයන්ගේ මග පෙන්වීම අනුව හැකිතාක් දුරට කළ යුතුය.

## 23. ජාතික සාකච්ජා සම්මේලනය

23.1 විශේෂ ප්‍රශ්නයක් ගැන පක්ෂයේ සාමාජිකත්වයේ අදහස් විමසා බැලීම සඳහා ජාතික සාකච්ජා සම්මේලනයක් කැඳවිය යුතුය.

23.2 ජාතික සාකච්ජා සම්මේලනයක් කැඳවීමේ අයිතිය පැවරෙන්නේ මධ්‍යම කාරක සභාවට පමණි.

23.3 ජාතික සාකච්ජා සම්මේලනයට සහභාගිවීමේ පදනම හා එය කැඳවීම පිළිබඳ වෙනත් අදාල කරුණු මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

## 24. මධ්‍යම පාලන කොමිෂම

24.1 ජාතික සම්මේලනය විසින් තෝරා පත් කරණු ලබන මධ්‍යම පාලන කොමිෂමේ ප්‍රථම රැස්වීම කැඳවනු ලැබිය යුත්තේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් විසිනි. එම රැස්වීමේදී කොමිෂමේ සාමාජිකයින් මධ්‍යම පාලන කොමිෂමේ සභාපති වශයෙන් තමන්ගෙන් කෙනෙකු තෝරා පත්කර ගත යුතුය. ඉන්පසු කොමිෂමේ රැස්වීම් කැඳවිය යුත්තේ කොමිෂමේ සභාපති විසිනි.

24.2 මධ්‍යම පාලන කොමිෂම, මධ්‍යම කාරක සභාව විසින් හෝ පක්ෂයේ වෙනත් යම් සංවිධානයක් විසින් හෝ තනි සාමාජිකයකු විසින් හෝ මධ්‍යම කාරක සභාව මගින් හෝ තමන් වෙත යොමු කරනු ලබන පක්ෂයේ විනය පාලනයට අදාල ඕනෑම කරුණක් ගැන පරීක්ෂා කොට මධ්‍යම කාරක සභාවට වාර්තා කළයුතුය.

24.3 මධ්‍යම පාලන කොමිෂම තම වාර්තාව මධ්‍යම කාරක සභාව මගින් ජාතික සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

## 25. මධ්‍යම විගණන කොමිෂම

25.1 ජාතික සම්මේලනය විසින් තෝරා පත් කරනු ලබන මධ්‍යම විගණන කොමිෂමේ ප්‍රථම රැස්වීම කැඳවනු ලැබිය යුත්තේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන ලේකම් විසිනි. එම රැස්වීමේදී කොමිෂමේ සාමාජිකයින් විසින් මධ්‍යම විගණන කොමිෂමේ සභාපති වශයෙන් තමන්ගෙන් කෙනෙකු තෝරා පත්කර ගත යුතුය. ඉන්පසු කොමිෂමේ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ කොමිෂමේ සභාපති විසිනි.

25.2 මධ්‍යම විගණන කොමිෂම සම්මේලනයට වාර්තා කිරීම සඳහා පක්ෂයේ මධ්‍යම ආයතනවල ගිණුම්ද, පක්ෂයට සම්බන්ධ සංවිධානවල, හා ආයතනවල, පක්ෂයට සම්බන්ධ වාණිජ හා ව්‍යාපාරික සංස්ථාවල ගිණුම්ද මධ්‍යම කාරක සභාව හෝ දේශපාලන බියුරෝ මණ්ඩලය හෝ විසින් යොමු කරනු ලැබූ විට එම බලධාරී මණ්ඩලය වෙනුවෙන් එම ගිණුම් විගණනය කළ යුතුය.

25.3 විගණනය සඳහා ගිණුම් කිසිවක් මධ්‍යම කාරක සභාව විසින් හෝ දේශපාලන බියුරෝ මණ්ඩලය විසින් හෝ බාර දෙනු ලැබූවිට, විගණන කොමිෂම ඒ පිළිබඳව තම වාර්තාව හැකිතාක් ඉක්මනින් බාර දිය යුතුය.

25.4 වියදම් අඩුකිරීමට හා පක්ෂයේ මුදල් තත්ත්වය වැඩි දියුණු කිරීම සම්බන්ධ නිර්දේශයන් ඉදිරිපත් කිරීම මධ්‍යම විගණන කොමිෂමේ යුතුකම වනු ඇත.

25.5 මධ්‍යම විගණන කොමිෂම ගිණුම් විගණනය කරනු ලබන ආකාරය තීරණය කරනු ඇත.

25.6 පරීක්ෂණයට භාජනයවන ගිණුම් සම්බන්ධයෙන් ඕනෑම පක්ෂ සාමාජිකයකුගෙන් හෝ අපේක්ෂක සාමාජිකයකුගෙන් හෝ ප්‍රශ්න කිරීමේ අයිතිය මධ්‍යම විගණන කොමිෂමට ඇත.

25.7 ගිණුම් නිසි පරිදි විගණනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරක්, ලියවිල්ලක් හෝ වාර්තාවක් සපයන මෙන් ඕනෑම පක්ෂ සාමාජිකයකුට, අපේක්ෂක සාමාජිකයකුට හෝ පක්ෂයේ ඕනෑම සංවිධානයකට නියෝග කල හැක. යම් ලියවිල්ලක් ඉදිරිපත් කිරීම නොමැනවැයි තීරණය කිරීමේ අයිතිය මධ්‍යම කාරක සභාව වෙත පැවරේ.

25.8 මධ්‍යම විගණන කොමිෂම තම වාර්තාව මධ්‍යම කාරක සභාව මගින් ජාතික සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

25.9 විගණනයට භාජනය වන ගිණුම් සම්බන්ධයෙන් වාර්තාවක් යටත් පිරිසෙයින් වසරකට වරක්වත් මධ්‍යම කාරක සභාවට හෝ දේශපාලන මණ්ඩලයට හෝ ඉදිරිපත් කළ යුතුය.

## 26. පක්ෂ කණ්ඩායම් (ප්‍රැක්ෂන්)

26.1 පක්ෂ සාමාජිකයින් දෙදෙනෙකුට නොඅඩු ගණනක් සිටින බහුජන සංවිධානයක විධායක හෝ මධ්‍යම විධායක හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය හෝ කමිටුවක, එම පක්ෂ සාමාජිකයින් පක්ෂ කණ්ඩායම් (ප්‍රැක්ෂන්) බවට පත්කළ හැකිය.

26.2 පක්ෂ කණ්ඩායම්වල කාර්යයන් පහත දැක්වෙන පරිදි වනු ඇත :-

26.2.1 පක්ෂ කණ්ඩායමට අයත්වන පක්ෂ සාමාජිකයින්ගේ කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය.

26.2.2 පක්ෂ කණ්ඩායමට අදාල බහුජන සංවිධාන තුළ එම බහුජන සංවිධානයේ සාමාජිකයින් අතර හා පොදුවේ ජනතාව අතර පක්ෂයේ ප්‍රතිපත්ති ජනප්‍රිය කරවීම.

26.2.3 පක්ෂ කණ්ඩායම්, අදාල බහුජන සංවිධානයේ කටයුතුවලට අදාල නොවන කරුණු ගැන සාකච්ඡා කිරීම හෝ තීරණ ගැනීම හෝ පක්ෂ ශාඛාවකට පැවරී ඇති මූලික අයිතිවාසිකම් පාවිච්චි කිරීම හෝ නොකළ යුතුය.

26.2.4 ජාතික මට්ටමේදී පක්ෂ කණ්ඩායම් මධ්‍යම කාරක සභාවේ හෝ එහි අදාල බියුරෝ මණ්ඩලයේ හෝ අංශයේ (දෙපාර්තමේන්තුවේ) මෙහෙයවීම යටතේ ක්‍රියා කළ යුතුය.

26.2.5 තම බලය යටතේ පවත්නා පක්ෂ කණ්ඩායමේ උපදෙස් පිට, එම පක්ෂ කණ්ඩායමේ කටයුතු අදාලවන බහුජන සංවිධානයේ කටයුතු සම්බන්ධ කරුණු පිළිබඳ සම්බන්ධීකරණය කිරීම, සාකච්ඡා කිරීම, තීරණය ගැනීම හා පක්ෂ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ හා ජනප්‍රිය කරවීම ආදී නිශ්චිත කාර්යය සඳහා එම සංවිධානයේ මට්ටමේ පක්ෂ සාමාජිකයින්ගේ රැස්වීම් කැඳවීමට මධ්‍යම කාරක සභාවට හෝ දිසා සභාවට හෝ ප්‍රාදේශීය සභාවට හෝ හැකිය.

26.2.6 පාර්ලිමේන්තුව හා පළාත්පාලන සභා වැනි ඒ ඒ ආයතනවලට තේරී පත්වූ නියෝජිතයින් වශයෙන් තනතුරු දරණ පක්ෂ සාමාජිකයින්ගෙන්ද පක්ෂ කණ්ඩායම් පිහිටුවිය හැකිය.

26.2.7 ඉහත උප නියමයේ සඳහන් පක්ෂ කණ්ඩායම්, ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන නියෝජිත ආයතනයන්හි නම් මධ්‍යම කාරක සභාව යටතේද, සෙසු නියෝජිත ආයතනයන්හි නම් අදාල දිසා සභා යටතේද වැඩ කළ යුතුය.

26.2.8 මේ නියමයේ සඳහන් ආයතනයක සාමාජිකත්වය දරන්නේ එකම පක්ෂ සාමාජිකයකු පමණක් වීම නිසා එම ආයතනනවල පක්ෂ කණ්ඩායමක් පිහිටුවිය නොහැකිනම් එම සාමාජිකයා යථායෝග්‍ය පරිදි කෙළින්ම මධ්‍යම කාරක සභාවේ හෝ දිසා සභාවේ හෝ මෙහෙය වීම යටතේ කටයුතු කරනු ඇත.

## 27. විනය පාලනය

27.1 විනය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, එහි අරමුණ විය යුත්තේ පක්ෂයේ විනයානුකූල හා සංවිධානාත්මක සමගිය ඇති කිරීමත් එහි දෘෂ්ටිමය පවිත්‍රත්වය සහතික කිරීමත්, සාමාජිකයින්ගේ පොදු පැවැත්ම හා දෘෂ්ටිමය හා දේශපාලන හැඩගැස්ම සංවර්ධනය කිරීමත්ය.

27.2 සාමාජිකයකු අයත් වන මූලික පක්ෂ සංවිධානයට එම සාමාජිකයාට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමේ අයිතිය තිබේ. එහෙත් අදාල සංවිධානය එම තීරණ ගැන තම ඉහළ සංවිධානයට අප්‍රමාදව වාර්තා කළ යුතුය.

27.3 පක්ෂයේ ඉහළ සංවිධානවලට අයත් සාමාජිකයකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමේ අයිතියක් පක්ෂයේ පහළ සංවිධානයකට නැත. කෙසේ වුවද ඉහළ සංවිධානයක සාමාජිකයෙකුගේ විනය සම්බන්ධයෙන් ක්‍රියාකිරීම අවශ්‍ය යයි තමන් සිතන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම සංවිධානයට පැමිණිලි කිරීමට පහළ සංවිධානයට අයිතිය ඇති අතර, එබඳු අවස්ථාවකදී පැමිණිලි කරන ලද කරුණ ගැන පරීක්ෂා කිරීමට ඉහළ සංවිධානය කටයුතු කළ යුතුය.

27.4 සාමාජිකයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ තීරණයක් අදාල සංවිධානයේ වැඩි ඡන්දයෙන් ගත හැකිය.

27.5 පහළ සංවිධානයකට හෝ එහි සාමාජිකයකුට හෝ විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමේ අයිතිය මධ්‍යම කාරක සභාවට හා දිසා සභාවට පැවරෙනු ඇත. කෙසේ වුවද එම තීරණ අදාල පහළ සංවිධානයට දැනුම් දිය යුතුය.

27.6 ඉහළ පක්ෂ සංවිධානයක වැඩ කෙරෙහි බලපාන විනය කඩ කිරීම්වලදී හෝ විනය කඩ කිරීමක් කෙළින්ම ඉහළ සංවිධානයක් තුළ එම සාමාජිකයාගේ වැඩ කෙරෙහි බලපාන අවස්ථාවලදී හෝ මිස, විනය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ සාමාජිකයකු තම මූලික සාමාජික අයිතිවාසිකම් පාවිච්චි කරන පක්ෂ ශාඛාව විසින් පමණි.

27.7 ශාඛාවකට හෝ සාමාජිකයකුට හෝ විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමේ අයිතිය ප්‍රාදේශීය සභාවලට නැත.

27.8 විනයානුකූලව ක්‍රියා කරනු ලබන්නේ යම් සාමාජිකයකුට හෝ පක්ෂ සංවිධානයකට හෝ විරුද්ධවද, එම සාමාජිකයාට හෝ සංවිධානයට හෝ තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ හා තම නිරවද්‍යතාව ඔප්පු කිරීමේ අයිතිය තිබේ.

27.9 විනයානුකූලව කටයුතු කරනු ලැබ ඇති සාමාජිකයකුට හෝ සංවිධානයකට විරුද්ධව පරීක්ෂණය පවත්වනු ලබන දිනය, වේලාව හා ස්ථානය ගැනද එම සාමාජිකයාට/සංවිධානයට ඇති චෝදනා ගැනද, පරීක්ෂණයට යටත් පිරිසෙයින් සති දෙකකට පෙර, එම සාමාජිකයාට/සංවිධානයට ලිඛිතව දැන්විය යුතු අතර, එම පරීක්ෂණයට පැමිණ සිටීමේ අයිතියද ලබාදිය යුතුය. කෙසේ වුවද සාමාජිකයා හෝ සංවිධානය හෝ නොපැමිණ ඇත්තේ එම පරීක්ෂණය පවත්වන පක්ෂ සංවිධානයට පිළිගත හැකි ප්‍රමාණවත් හේතුවක් නොමැතිව නම් එසේ නොපැමිණීම නොතකා පරීක්ෂණය කරගෙන යා හැකිය.

27.10 පක්ෂයේ සංවිධානාත්මක සමගිය හා දේශපාලන ප්‍රතිරූපය කෙරෙහි බලපෑ හැකි බරපතල විනය විරෝධී ක්‍රියා පිළිබඳ චෝදනා ඇති විට අදාල සාමාජිකයා සාමාජිකත්වයෙන්ද අදාල පක්ෂ සංවිධානයේ ක්‍රියාකාරීත්වයෙන් ද අත්හිටුවීම විනය පිළිබඳ ක්‍රියා කිරීමට බලය ලත් පක්ෂ සංවිධානයකට හැකිය. කෙසේ වුවද එසේ අත්හිටුවීමෙන් සති හයක් ඇතුළත පරීක්ෂණය ආරම්භ කළ යුතුය.

27.11 සියලු විනය පිළිබඳ පරීක්ෂණ ඒවා පටන්ගනු ලැබීමෙන් තුන් මසක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. පහළ සංවිධානයක් විසින් කරනු ලබන ඉල්ලීමක් පිට එම කාලය තවත් කාල පරිච්ඡේදයෙකින් දීර්ඝ කිරීමට මධ්‍යම කාරක සභාවට හැකිය.

27.12 තමන්ට විරුද්ධව ගන්නා ලද විනය පිළිබඳ තීන්දුවකට විරුද්ධව ජාතික සම්මේලනය ඇතුළු ඉහල පක්ෂ සංවිධානයක් වෙත අභියාචනා කිරීමේ අයිතිය ඕනෑම සාමාජිකයකුට හෝ පක්ෂ සංවිධානයකට හෝ තිබේ.

27.13 විනය පිළිබඳ තීන්දුවකට විරුද්ධව ජාතික සම්මේලනයට ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් ගැන සම්මේලනයේ කටයුතු අවසන්වීමට පෙර තීරණය කළ යුතුය.

27.14 විනය පිළිබඳ තීන්දුවකට විරුද්ධව ඉහළ පක්ෂ සංවිධානයක් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් ගැන එම සංවිධානය විසින් අභියාචනය ලැබී මසක් ඇතුළත ඒ පිළිබඳව කටයුතු අවසන් කළ යුතුය.

27.15 ඉහළ පක්ෂ සංවිධානයක් වෙත ඉදිරිපත් කරල ලද අභියාචනය පිළිබඳ තීන්දුවකින් පක්ෂ සංවිධානයක් විසින් ගනු ලැබු විනය පිළිබඳ තීන්දුවක් අවලංගු වන තුරු යථොක්ත අභියාචනය මුල් තීන්දුව ක්‍රියාත්මකවීමට බල නොපාන්නේය.

## 28. සාමාජිකයන්ට හා පක්ෂ සංවිධානයන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා

පහත සඳහන් හේතු උඩ සාමාජිකයකුට හෝ පක්ෂ සංවිධානයකට හෝ විරුද්ධව විනයානුකූලව ක්‍රියා කළ යුතුය :

28.1 පක්ෂ සටන්මග ප්‍රතිපත්තිය හා ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම.

28.2 පක්ෂ තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම හා පැහැර හැරීම.

28.3 කඩාකප්පල්කාරී හා කල්ලිවාදී කටයුතුවල යෙදීමෙන් පක්ෂයේ සමගියට විරුද්ධව ක්‍රියා කිරීම.

28.4 පක්ෂයේ අරමුදල් සම්පත් හා දේපල වැරදි ලෙස පරිහරණය කිරීම.

28.5 පක්ෂයට අපකීර්තිය ගෙනෙන පෞද්ගලික හෝ සමාජ පැවැත්ම.

28.6 පක්ෂය ඉදිරියේ අවංක හා සත්‍යගරුක නොවීම.

28.7 පක්ෂ සාමාජිකයින්ට විරුද්ධව අවලාද ප්‍රචාරය කිරීම.

## 29. සාමාජිකයින්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීම - දඬුවම්

සාමාජිකයකුට විරුද්ධව පහත සඳහන් විනයානුකූල පියවරවල් ගත හැකිය.

29.1 අවවාද කිරීම.

29.2 අවවාද කිරීම හා පක්ෂ අභ්‍යන්තර දෝෂ දර්ශනයට ලක් කිරීම.

29.3 දෝෂ දර්ශනයට ලක් කිරීම.

29.4 පක්ෂයේ දරණ ලද තුනතුරුවලින් ඉවත් කිරීම හා/හෝ පක්ෂ සංවිධානයක තනතුරකට තේරී පත්වීමේ අයිතිය අවුරුදු දෙකකට නොවැඩි නිශ්චය කරන ලද කාල පරිච්ඡේදයකට අත්හිටුවීම.

29.5 හය මසකට නොවැඩි නිශ්චය කරන ලද කාලපරිච්ඡේදයකට සාමාජිකත්වය අත්හිටුවීම.

29.6 සාමාජිකයකු අපේක්ෂක සාමාජිකයකුගේ මට්ටමට පහත හෙළීම.

29.7 පක්ෂ සාමාජිකත්ව ලේඛනයෙන් ඉවත් කිරීම.

29.8 නෙරපීම.

## 30. පක්ෂ සංවිධානයකට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකිරීම - දඬුවම්

පක්ෂ සංවිධානයකට විරුද්ධව පහත සඳහන් විනයානුකූල පියවර ගත හැකිය.

30.1 අවවාද කිරීම.

30.2 අවවාද කිරීම හා පක්ෂ අභ්‍යන්තරයේ දෝෂ දර්ශනයට ලක් කිරීම.

30.3 පක්ෂ සංවිධානය ප්‍රතිසංවිධානය කිරීම.

30.4 හය මාසයකට නොවැඩි නිශ්චය කරන ලද කාලයකට සංවිධානය අත්හිටුවීම.

30.5 විසුරුවා හැරීම.

## 31. පක්ෂ අරමුදල්, සම්පත් හා දේපල

31.1 මධ්‍යම කාරක සභාව, පක්ෂයේ වානිජ ව්‍යාපාරික ආයතන ද ඇතුළුව පක්ෂයේ අරමුදල්, සම්පත් හා දේපල කෙරෙහි මධ්‍යම පාලනය පැවැත්විය යුතුය.

31.2 පක්ෂ දේපල කළමනාකරණය සඳහා සංවිධාන පිහිටුවීමේ හෝ තම තීරණයන් අනුව ඇති කරන ලද භාරකාර මණ්ඩලවලට එම දේපල පැවරීමේ හෝ අයිතිය මධ්‍යම කාරක සභාවට පැවරෙනු ඇත.

31.3 ජාතික, දිස්ත්‍රික්, ප්‍රදේශ හා ශාඛා මට්ටම්වලින් පක්ෂය සඳහා අරමුදල් එකතු කිරීම පිණිස වන සියළුම ව්‍යාපාර පක්ෂයේ පූර්ව අනුමැතිය ඇතිව ගෙන යා යුතු අතර, එම එකතු කිරීම් පිළිබඳ නිසි ගිණුම් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය.

31.4 පක්ෂ අරමුදල්, සම්පත් හා දේපල සම්බන්ධයෙන්ද ඒවායේ නිසි පාලනය හා කළමණාකරණය සම්බන්ධයෙන්ද මධ්‍යම කාරක සභාවට පවරනු ලැබ ඇති බලතල පාවිච්චි කිරීමට දේශපාලන බියුරෝ මණ්ඩලයට හැකිය.

## 32. සාමාජික මුදල්

ජාතික සම්මේලනය සාමාජික මුදල් අය කරනු ලබන පදනම තීරණය කළ යුතුය.

## 33. ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හා ඒ පිළිබඳ අර්ථ නිරූපනය කිරීම.

33.1 ව්‍යවස්ථාව පිළිබඳ අර්ථ නිරූපනය කිරීමේ අයිතිය මධ්‍යම කාරක සභාවට පැවරේ.

33.2 ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ අයිතිය පැවරෙන්නේ ජාතික සම්මේලනයකට හා විශේෂ ජාතික සම්මේලනයකට පමණය.

33.3 මධ්‍යම කාරක සභාවට ජාතික සම්මේලනයකදී හෝ විශේෂ ජාතික සම්මේලනයකදී හෝ ව්‍යවස්ථාවට සංශෝධන යෝජනා කිරීමේ අයිතිය තිබේ.

33.4 මධ්‍යම කාරක සභාව, ජාතික සම්මේලනයට හෝ විශේෂ ජාතික සම්මේලනයට යටත් පිරිසෙයින් සති හයකට පෙර යෝජිත සංශෝධන සලකා බැලීම සඳහා පක්ෂ ශාඛාවලට ඉදිරිපත් කළ යුතුය.

33.5 ව්‍යවස්ථාව සංශෝධනය කළ යුත්තේ ජාතික සම්මේලනයකට හෝ විශේෂ ජාතික සම්මේලනයකට සහභාගි වන නියෝජිතයින්ගෙන් තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවක ඡන්දයෙනි.